# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

ග්‍රාමීය සංවර්ධන , සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය
கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சு
Ministry of Rural Development, Social Security and Community Empowerment


| මගේ අංකය<br>எனது இல<br>My No | DSD/HO/MF/05/08/01/ චක්‍රලේඛ | ඔබේ අංකය<br>உமது இல<br>Your No | ............................ | දිනය<br>திகதி<br>Date | 2025.05.28 |
|---|---|---|---|---|---|

**සමෘද්ධි ප්‍රජාමූල බැංකු චක්‍රලේඛ අංක - 2022/08ට පස්වන එකතුව**

**සියළුම සමෘද්ධි ප්‍රජාමූල බැංකු පාලක මණ්ඩල/බැංකු සමිති විධායක කමිටු සභාපතිවරුන්,**
**සමෘද්ධි ප්‍රජාමූල බැංකු කළමනාකරුවන්/බැංකු සමිති කළමනාකරුවන්,**

**<u>සමෘද්ධි ප්‍රජාමූල බැංකු සඳහා ස්ථාවර තැන්පතු ( කාලීන තැන්පතු) ගිණුම් හඳුන්වාදීම.</u>**
**<u>ස්ථාවර තැන්පතු සඳහා වාර්ෂික පොළී අනුපාත සංශෝධනය කිරීම.</u>**

01. සමෘද්ධි ප්‍රජාමූල බැංකු විසින් පවත්වාගෙන යන ස්ථාවර (කාලීන) තැන්පතු ගිණුම් සඳහා වාර්ෂිකව ගෙවනු ලබන පොළී අනුපාත සංශෝධනය කිරීම සඳහා 2025.05.15 දින පැවති සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති කළමනාකරණ මණ්ඩල තීරණ අංක <u>2025/136/02</u> මගින් අනුමැතිය ලැබී ඇත. ඒ බව දැනුම් දීමට මෙම නව චක්‍රලේඛ එකතුව නිකුත් කරන බව දන්වමි.

02. නව වාර්ෂික පොළී අනුපාතයන් පහත වේ.

| කාල සීමාව (මාස) | වාර්ෂික පොළී අනුපාතය (කල්පිරීම අවසානයේ දී පොළී මුදල ගන්නා විටක) | වාර්ෂික පොළී අනුපාතය (මාසික පොළී මුදල ගන්නා විටක) |
|---|---|---|
| 03 | 6.0% | - |
| 06 | 6.5% | - |
| 12 | 7.5% | 7.00 % |
| 24 | 7.75% | 7.25 % |
| 36 | 8.0 % | 7.50 % |

03. ස්ථාවර තැන්පතු සඳහා වූ වාර්ෂික පොළී අනුපාත සංශෝධනය කිරීමට සාපේක්ෂව ස්ථාවර තැන්පතුව ඇපයට තබා ලබාදෙන ස්වශක්ති ණය මුදල් සඳහා නව වාර්ෂික පොළී අනුපාතය වනුයේ, ස්ථාවර තැන්පතු සහතිකයේ සඳහන් වාර්ෂිකව පොළී අනුපාතයට අමතරව 2.5% ක් එකතු කර ලැබෙන අගය වේ.

04. කල්පිරුණු ආයෝජන මුදලක් නැවත ආයෝජනය කරන ගිණුම්හිමියන්ට පමනක් විශේෂ වරප්‍රසාදයක් ලබාදෙනු ලැබේ. එනම්, මුල් මුදල හා ලැබුණු පොළී මුදල නැවත ආයෝජනය කිරීමේදී, ගිණුම්හිමියකුට තැන්පත් කලහැකි උපරිම මුදල ඉක්මවා ගිය ද, මෙම නැවත ආයෝජනය මුදල තැන්පත් කිරීමට ඉඩදෙනු ලැබේ. මෙම අවස්ථාව හිමිවන්නේ එම තැන්පතු මුදලට එක් අවස්ථාවක් පමණි.

උදා:- යම් ගිණුම් හිමියෙකු රු 2,750,000.00 ක මුදලක් තැන්පත් කර, අදාල දිනයට කල්පිරුණු පසු පොළී මුදල ලෙස රු 450,000.00 ක මුදලක් ලැබී ඇත. තවද මෙම බැංකුව A ශ්‍රේණියේ බැංකුවක් වන අතර, ගිණුම් හිමියෙකුට උපරිම රු මිලි. 3 ක් තැන්පත් කල හැක. ගිණුම් හිමියාගේ මුල් මුදල හා පොළී මුදල එකතු කල විට , රු 3,200,000.00 කි. එම මුදල නැවත ආයෝජනය කිරීමට බැංකුවට ඉඩ දෙනු ලැබේ. මෙහි තැන්පත් මුදලට මෙම අවස්ථාව හිමිවන්නේ එක් අවස්ථාවක් පමණි.

05. යම් පුද්ගලයෙකු , අළුතින්ම රු.මිලි.01 ක් හෝ ඊට වැඩි මුදලක් තැන්පත් කිරීමට කැමැත්ත දක්වා, ඒ සඳහා විශේෂ පොළී අනුපාතයක් තැන්පත්කරු ඉල්ලා සිටින විටක, බලපවත්වන වාර්ෂික පොළී අනුපාතයට අමතර උපරිම 1%ක විශේෂ පොළී අනුපාතයක් ලබාදීමට අධ්‍යක්ෂ ජනරාල්ගේ විශේෂ අනුමැතිය යටතේ බැංකු කළමනාකරුට අවසර ඇත. මෙහිදී මුදල් තැන්පත් කරන පුද්ගලයා සමග පියවරෙන් පියවර සාකච්ඡා කර


1වන අදියර,4 වන මහල , සෙත්සිරිපාය , බත්තරමුල්ල. / 1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல / 1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල්<br>பணிப்பாளர் தலைமையதிபதி<br>Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන)<br>மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்)<br>Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී<br>பிரதான கணக்காளர்<br>Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)<br>பணிப்பாளர் (குறு நிதி )<br>Director (Micro Finance) | කාර්යාලය<br>அலுவலகம்<br>Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2869824 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dgsamurdhi@gmail.com | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887722** |
| | | **Hot Line :0112-889007** | | | |

අමතර 1% ලබාදීම පිළිබඳ සාකච්ජා කර එකඟතාවයකට පැමින දෙපාර්තමේන්තු අනුමැතියට ඉදිරිපත් කල යුතුය. මෙම තැන්පත් මුදල අවු.01 ක් හෝ ඊට වැඩි කාලයක් සඳහා වූ අයෝජනයක් විමද අනිවාර්ය වේ.
මෙම අනුමැතිය ඉල්ලීම ලිඛිතව හෝ දුරකථනයෙන් ලබාගත යුතුය. ලබාගත් අනුමැතිය සටහන් කිරීමට රෙජිස්තරයක් බැංකුව විසින් නඩත්තු කල යුතුය.
microfinance2021@gmail.com විද්‍යුත් ලිපිනය හරහා ලිඛිතව ඉල්ලීම ක්ෂුද්‍ර මූල්‍ය අංශයට එවන ලෙසත් දන්වමි.

06. මෙම චක්‍රලේඛ උපදෙස් හා නව වාර්ෂික පොළී අනුපාත 2025.06.01 දින සිට බල පවත්වන බවද දන්වමි.

07. සංශෝධන මෙපමණ වන අතර, අනිකුත් උපදෙස් සඳහා සමෘද්ධි ප්‍රජාමූල බැංකු චක්‍රලේඛ 2017/12 සහ 2022/08 හා ඊට එකතුන් සඳහා උපදෙස් වලංගු කර ගන්නා ලෙසද දන්වමි.

සී.ඩී.කළුආරච්චි
අධ්‍යක්ෂ ජනරාල්

**පිටපත්**

1. ලේකම්, ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය -කා.දැ.පි.
2. සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්/දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්
   - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කා.දැ.පි.
3. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.පි.
4. සියලුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කා.දැ.පි හා අ.ක.ස.
5. සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - කා.දැ.පි හා අ.ක.ස.
6. සමෘද්ධි නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂවරුන්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කා.දැ.පි හා අ.ක.ස.